**ජාතික තරුණ සේවා සභාව - 2022**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික තරුණ සේවා සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර,ජාතික තරුණ සේවා සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ පරික්ෂා කිරිමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්**,**

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 99 ඡේදය ප්‍රකාරව කාලපරිච්ඡේදය තුළ හඳුනාගත් සියළුම ආදායම් හා වියදම් අයිතම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුළත් කළ යුතු වුවද ,පෙර වර්ෂයට අදාල එකතුව රු. මිලියන 93 ක් වූ වියදම් සඳහා උපචිත වියදම් ප්‍රතිපාදන සලසා නොතිබීම හේතුවෙන් ආරම්භක ණයහිමි ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි . | එම බිල්පත් සඳහා ගෙවීම් කර ඇති අතර ඉතිරි බිල්පත් ප්‍රමාණය 2022 මූල්‍ය ප්‍රකාශනයේ ණයහිමියන් ලෙස ගිණුම් ගත කර කර ඇත. | ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 49ඡේදය ප්‍රකාරව ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී එම වත්කම් කාණ්ඩයට අයත් සියළුම දේපළ ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද 2021 ,වර්ෂයේදී මධ්‍යස්ථාන 05 කට අයත් රු. මිලියන 46ක්වූ ගොඩනැගිලි සහ 2022වර්ෂයේ දී මධ්‍යස්ථාන 03කට අයත් රු. මිලියන 242ක්වූ ගොඩනැගිලි 02ක් සහ ඉඩම් 03 ක් ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර තිබුණි. | ඉඩම් හා ගොඩනැඟිලි සඳහා රජයේ තක්සේරු වාර්තා ලබා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර ඇති අතර රජයේ තක්සේරු වාර්තා ලැබීමෙන් පසුව අනෙකුත් ඉඩම් හා ගොඩනැඟිලි ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 14 හි 40 වන ඡේදය ප්‍රකාරව ප්‍රධාන කළමනාකරණ පිරිසගේ සමුච්චිත පාරිශ්‍රමිකය හෙළිදරව් කළ යුතු වුවද ,සමාලෝචිත වර්ෂයේදී සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමේ සභාපති ලෙස කටයුතු කිරීම වෙනුවෙන් ජාතික තරුණ සේවා සභාවේ සභාපති වෙත ගෙවා තිබූ | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හී හෙළිදරව් කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |

| | | |
|---|---|---|
| රු.460,000 ක්වූ දීමනා මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | | |
| (ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01 හි 27 ඡේදය ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දිනට සභාව විසින් භුක්ති විඳිමින් පැවති ඉඩම් 61 කට අදාළ අක්කර 234.69 ක් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණු අතර සභාව සතු අක්කර 06 පර්චස් 57.78 ක්වූ ඉඩම් 06 ක වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශයන්හී හෙළිදරව් කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතුය. |
| (ඉ) ගබඩාව හා රියදුරු නේවාසිකාගාර ඉදිකිරීමේ ව්‍යාපෘතිවලට අදාළව කොන්ත්‍රාත්කරු විසින් සමාලෝචිත වර්ෂයේ දීර්ඝ කිරීමේ පිරිවැය (Prolongation cost) ,මිල විචලනය සහ ප්‍රමාද ගාස්තු වශයෙන් ඉදිරිපත් කර තිබූ රු. මිලියන7 .3 ක බිල්පත් සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 8 හි 22 ඡේදය ප්‍රකාරව ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබුණි. | 2023 වර්ෂයේ සිට නිවැරදිව මූල්‍ය ප්‍රකාශනයන්හී හෙළිදරව් කිරීමට කටයුතු කරමි. | ගිණුම් ප්‍රකාශනවල නිවැරදිව හෙළිදරව් කල යුතුය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2012-2019 වර්ෂවල ආරම්භ කරන ලද කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇතුලත් රු. මිලියන 520 ක්වූ ව්‍යාපෘති 10 කින් රු. මිලියන 14 ක් පිරිවැය වූ ව්‍යාපෘති 07 ක් ප්‍රතිපාදන නොලැබීම මතද, රු. මිලියන 159 ක්වූ ව්‍යාපෘති 03 ක් නියමිත දිනට නිම නොකිරීම හේතුවෙන් සභාව විසින් අත්හිටුවා තිබුණි. | කෙරීගෙනයන වැඩ ගිණුමේ ඇතුලත් ආරම්භ කරන ලද ව්‍යාපෘති 07 සඳහා සැලසුම් හා ඇස්තමේන්තු සකස්කර අවසන්කර ඇතත් කොන්ත්‍රාත් කාර්ය ආරම්භකර ඉදිකිරීම් අවසන් කිරීමට ප්‍රාග්ධන ප්‍රතිපාදන ඉල්ලා ඇති නමුත් ප්‍රතිපාදන වෙන් නොවූ බැවින් ඉදිකිරීම් සිදුකිරීමට නොහැකිවී ඇති බව දන්වා සිටිමි. | ඉදිකිරීම් වැඩ නැවත ආරම්භ කර ගොඩනැගිලි සම්පූර්ණ කිරීමට ක්‍රියාකල යුතුය. |
| (ආ) කෙරීගෙන යන වැඩ ගිණුමෙහි ඇතුළත් 2021 සිට 2022 අතර වර්ෂවල වැඩ නිම කර භාවිතයට ගෙන තිබුණු වැඩ නිම කල ඉදිකිරීම් ව්‍යාපෘති 02 කට අදාළ රු. මිලියන 180 ක් ගොඩනැගිලි ගිණුමට ප්‍රාග්ධනිත කර නොතිබුණි. එමෙන්ම ඊට අදාළ ක්ෂය රු. මිලියන 9 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌනතාවයද එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | කෙරීගෙනයන වැඩතුල ඇතුලත් ගබඩාව හා රියදුරු නේවාසිකාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය සහ පොල්ගොල්ල පුහුණු මධ්‍යස්ථානය නවීකරණය කිරිමේ ව්‍යාපෘතිවලට අදාලව අවසාන කාර්මික වාර්තා (Completion Report)නොලැබීම නිසා වැඩනිමි ගිණුමට අදාල ශේෂයන් මාරුකර නොමැති අතර විගණනයේ පෙන්වා ඇති පරිදි 2023 වර්ෂයේ වැඩනිමි ගිණුමට මාරුකිරිම හා ක්ෂය ගැලපිම සිදුකරන බව දන්වා සිටිමි. ගැලපීමට අදාල ජ'නල් සටහන් මේ සමග ඉදිරිපත් කරමි. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඇ) මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර තිබූ රු. මිලියන 74.7 ක්වූ ඉඩම් 12 ක හිමිකම සනාථ කර නොතිබුණි. | ඉඩම් වටිනාකම් තුල පවතින අනෙකුත් ඉඩම් ද ජාතික තරුණ සේවා සභාව භුක්ති විදින ලබන අතර එම ඉඩම් සංවර්ධනය වෙනුවෙන් දරන ලද ප්‍රාග්ධනිත කලහැකි වටිනාකම් ගිණුම් ගත කර ඇත. මෙම නිත්‍යානුකුල අයිතිය නොමැති ඉඩම් | වත්කම් භෞතික සත්‍යාපනය කර ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| | වල නිත්‍යානුකූල අයිතිය ලබා ගැනීම සඳහා නොකඩවා කටයුතු සිදු කරමින් පවතී. | |
| (ඈ) 2014 - 2018 වර්ෂවල සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණු රු. මිලියන 2.8 ක්වූ දේපල පිරියත හා උපකරණ යටතේ දක්වා තිබූ තාවකාලික ඉදිකිරීම් භෞතිකව නොපැවතුණි. | 2023 වර්ෂයේදී භෞතික සත්‍යාපනයක් සිදුකොට ගිණුම්වල අවශ්‍ය ගැලපීම් සිදුකිරිමට කටයුතු කරන බව දන්වා සිටිමි. | වත්කම් භෞතික සත්‍යාපනය කර ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර වත්කම් මිලදී ගැනීම් සඳහා රු. මිලියන 9.8 ක් මුදලින් ගෙවා තිබුණද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මිලදීගැනීම් රු. මිලියන 52.8 ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් රු. මිලියන 43 ක් වැඩියෙන් දක්වා තිබුණි. | මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මිලදී ගැනීම් තුල පූර්ව වර්ෂයේ මිලදී ගැනීම් සඳහා 2022 වර්ෂයේ මුදල් ගෙවීම් වටිනාකම ඇතුළත්ය. තවද, කෙරීගෙන යන වැඩ ගිණුමෙන් 2022 වර්ෂයේදී නිම් ගිණුමට මාරු කරන ලද ශේෂයද වර්ෂයේ මිලදී ගැනීම් යටතේ දක්වා ඇත. | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී නිවැරදිව පිළියෙල කල යුතුය. |
| (ඊ) සමාලෝචිත වර්ෂයේ කෙරීගෙන යන වැඩ සඳහා රු. මිලියන 8.2 ක් මුදලින් ගෙවා තිබුණද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව එය රු.මිලියන 0.5 ක ලැබීමක් ලෙස දක්වා තිබීම හේතුවෙන් ආයෝජන ක්‍රියාකාරකම් රු.මිලියන 8.7 ක් අඩුවෙන් දක්වා තිබුණි. | කෙරීගෙනයන වැඩ ගොඩනැඟිලි හා කෙරීගෙනයන වැඩ වෙනත් වත්කම් ගිණුම් වල 2021 වර්ෂයේ අවසාන ශේෂය හා 2022 වර්ෂයේ ශේෂයන් හී වෙනස ගැලපීම් මගින් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස්කර ඇත. | මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී නිවැරදිව පිළියෙල කල යුතුය. |
| (උ) 2020 සහ 2021 වර්ෂවල වැඩ නිමකර භාවිතයට ගෙන තිබූ ඉදිකිරීම් ව්‍යාපෘති දෙකකට අදාල රු. මිලියන 9 ක් වූ ගොඩනැගිලි ප්‍රාග්ධනිත කිරීමකින් තොරව පුනරාවර්තන වියදම් ලෙස එම වර්ෂවලදී කපා හැර තිබුණි. | 2023 වර්ෂයේ දී මෙම නිවැරදි කිරීම ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම් වර්ගීකරණය නිවැරදිව කළ යුතුය. |
| (ඌ) යෞවන තිළිණ අංශයේ ජංගම ගිණුමේ රු. මිලියන 1.3 ක්වූ ශේෂය මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. | ජාතික යෞවන තිළිණ අංශයේ ජංගම ගිණුම් ශේෂය 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරන බව දන්වා සිටිමි. | සභාවේ කාර්යයන් ඉටු කිරීම මගින් ලැබෙන අරමුදල් සභාවේ පොදු අරමුදලක ගිණුම්ගත කළ යුතුය. |
| (එ) 2022 වර්ෂයේ සහ ඊට පෙර වර්ෂවල ඉවත්ව ගිය නිලධාරීන් 10 දෙනෙකු වෙනුවෙන් ගෙවිය යුතු පාරිතෝෂික දීමනා රු. මිලියන 4.4 ක් සමාලෝචිත වර්ෂයේ උපචිත වියදම් ලෙස දක්වා නොතිබුණි. | 2023 වර්ෂයේ සිට එම වටිනාකම සමාලෝචිත වර්ෂයේ උපචිත වියදමක් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශන නිවරදිව පිළියෙළ කළ යුතුය. |
| (ඒ) 2021 වර්ෂයේදී ඉල්ලා අස්වූ නිලධාරීන් 05 දෙනෙකු සඳහා පාරිතෝෂික රු.966,712 ක් සමාලෝචිත වර්ෂයේ වෙන්කර තිබුණු අතර, 2022 වර්ෂයේ නිලධාරීන් දෙදෙනෙකුට සේවයෙන් ඉවත් වීමෙන් පසු කාලයට සේවක අර්ථසාධක හා සේවක භාරකාර අරමුදල් ඇතුළුව වැටුප් ලෙස රු.265,231 ක් ගෙවා තිබුණි. 1999 වර්ෂයේ හා 2001 | 2023 වර්ෂයේ සිට නිවැරදිව ගිණුම්ගත කරමි. | මූල්‍ය ප්‍රකාශන නිවරදිව පිළියෙල කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වර්ෂවලදී සේවයෙන් ඉවත්වූ නිලධාරීන් පස්දෙනෙකු සඳහා රු. මිලියන 1.3 ක්වූ පාරිතෝෂික අප්‍රමාදව ගෙවීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඕ) | මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනත් බැරකම් යටතේ විදේශ සංවිධාන ලෙස දක්වා තිබූ එකතුව රු. මිලියන 4.9 ක්වූ බාහිර ආයතන 04 ක ලැබීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් නොකිරීම හේතුවෙන් එම ගනුදෙනුවල නිවැරදිතාවය, සම්පූර්ණත්වය හා පැවැත්ම තහවුරු කර ගැනීමට නොහැකි විය. | 2023 වර්ෂයේදී සහා අධ්‍යක්ෂ මණ්ඩලයට මේ පිළිබඳව සවිස්තරාත්මක විස්තර වාර්තාවක් ලබාදී අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් ආදායමට ගැනිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන නිවරදිව පිළියෙල කළ යුතුය. |

### 1.5.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| රු. | රු. | රු. | | |
| 10,065,342 | 80,232,338 | 70,166,996 | 2023 වර්ෂය අවසානයේ සීමාසහිත තරුණ සේවා සමාගම සහ ජාතික තරුණ සේවා සභාවේ ඒකාබද්ධ ගිණුම් සකස් කිරීමේදී දෙපාර්ශවය අතර සිදු වූ ගණුදෙණු නිවැරදිව සැසදීමක් කරන බැවින් 2023 වර්ෂය අවසානයේ මෙම තත්වය නිරවුල් කිරීමට කටයුතු කරමි. | සීමාසහිත ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමට ගෙවිය යුතු ණය ශේෂ සමාගමේ තොරතුරු සමග පරීක්ෂා කර නිවැරදි කළ යුතුය. |

### 1.5.5 ඒකාබද්ධ කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ජාතික තරුණ සේවා සභාවේ සියයට 98 ක කොටස් හිමිකාරත්වයක් ඇතිව සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම 1981 වර්ෂයේදී ආරම්භ කර තිබුණද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබූ අතර , සමාගම විසින් 2018 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2023 වර්ෂයේ සිට සීමාසහිත තරුණ සේවා සමාගම සමඟ ඒකාබද්ධ ගිණුම් සකස් කිරීමට අවශ්‍ය කටයුතු කරමි. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**ලැබිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ලැබිය යුතු ශේෂය තුල ඇතුළත් වර්ෂ 2000 සිට 2019 වර්ෂය දක්වා කාලසීමාවට අදාළ අයකර ගෙන නොතිබූ එකතුව රු. මිලියන 1.2 ක්වූ ශේෂයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2022 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂයන් තුල වර්ෂ 3ත් 22ත් අතර කාලපරිච්ඡේදයකට අදාලව අයකර නොගත් රු. මිලියන 1.2 ක ශේෂයක් ඇත | අයවිය යුතු මුදල් අයකර ගැනිමට හෝ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වසර දෙකකට වඩා පැරණි රු. මිලියන 1.8 ක්වූ ගෙවිය යුතු තැන්පත් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. ඊට අමතරව, එකතුව රු. මිලියන 16.4 ක් වූ වසර 05 කට වඩා පැරණි විවිධ ණයහිමියන්, නොගෙවූ වැටුප්, නොගෙවූ රඳවා ගැනීම්, ගෙවිය යුතු තැන්පත් සහ වැටුප් තැන්පත් වල ශේෂ නිරවුල් කර නොතිබුණි. | 2023 වර්ෂයයේදී අදාල ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කරමි. | ගෙවිය යුතු තැන්පත් නිරවුල් කිරීමට කටයුතු කළ යුතු බව |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත නිරීක්ෂණ කරනු ලැබේ

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 8 වගන්තිය | සෑම මුදල් වර්ෂයක් සම්බන්ධයෙන්ම අයවැය ලේඛණයක් පිළියෙල කල යුතු වුවද, සභාව විසින් සකස් කරන ලද අයවැය ලේඛණයෙහි අරමුදල් ලැබෙන මාර්ග පිළිබඳව පුරෝකථනය සිදු නොකර වියදම් පමණක් පුරෝකථනය කර තිබුණි. | 2023 වර්ෂයේ සිට අරමුදල් ලැබෙන මාර්ග සවිස්තර පුරෝකථන වාර්තාවක් ඉදිරිපත් කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ මුදල් රෙගුලාසි 156 සහ ආයතන සංග්‍රහයේ II කොටස | රු .මිලියන10 .9 ක් පිරිවැය වූ කුකුල් කෑම මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී ප්‍රසම්පාදන මණ්ඩලයේ අනුමත සීමාවන් ඉක්මවා අනුමත කිරීම හා වෙනත් ගොවිපොලවල සඳහන් මිල ගණන් නොසසඳා නොසැලකිලිමත් භාවයකින් කටයුතු | කුකුල් කෑම මිලදී ගැනීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්බන්ධයෙන් නොසැලකිලිමත් භාවයෙන් කටයුතු කිරීම පිළිබඳව සොයාබලා විනයානුකූලව කටයුතු කිරීම සඳහා පියවර ගනිමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කිරීම නිසා සිදු වී තිබූ දළ වශයෙන් රු .මිලියන 4.6 ක පාඩුව සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි . | | |
| (ඇ) 2018 දෙසැම්බර් 07 දිනැති අංක **PS/SP/SB/21/2018** දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය | සභාව සතුව නේවාසික පාඨමාලා පැවැත්වීම සඳහා පුහුණු මධ්‍යස්ථාන වල ප්‍රමාණවත් පහසුකම් තිබියදී, ප්‍රජා හා ධාරිතා සංවර්ධන වැඩසටහන බාහිර ආයතනයක පවත්වා නේවාසික ගාස්තු, ආහාර ගාස්තුලෙස රු. මිලියන 24.2 ක් ගෙවා තිබුණි. | මෙම වැඩසටහන සඳහා අරමුදල් සම්පාදනය කරන පෞද්ගලික ආයතනයේ ඉල්ලීම මත වැඩසටහන පැවැත්වීමට කටයුතු සිදු කර ඇති අතර, කොරෝනා වසංගත තත්ත්වය හමුවේ ආරම්භ කල බැවින් එක් ස්ථානයකින් වැඩසටහන සිදු කර යාම සඳහා අවශ්‍ය පහසුකම් සපයා ගැනීම, කොරෝනා වෛරස තත්වය ව්‍යාප්ත නොවන පරිදි ආයතනයෙන් නේවාසික, ආහාර සහ සංග්‍රහ ලබා ගැනීම සිදු කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) 2015 සැප්තැම්බර් 25 දිනැති අංක SP/SB/07/15 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛය | උත්සවණ හා වැඩමුළු සම්මන්ත්‍ර , සඳහා අවම පිරිවැයක් යටතේ ලබාගත හැකි ආයතන පමණක් යොදා ගන්නා ලෙස දක්වාතිබුණද, ඊට අනුගත නොවී ප්‍රසම්පාදන ක්‍රමවේදයන් අනුගමනය නොකර ප්‍රජා හා ධාරිතා සංවර්ධන වැඩසටහන පෞද්ගලික ආයතනයක් මගින් ක්‍රියාත්මක කිරීමට සභාව විසින් කටයුතු කර තිබුණි. | මිල ගණන් කැඳවා ටෙන්ඩර් අනුමැතිය ලබාගෙන වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඉ) 2021 දෙසැම්බර් 21 දිනැති අංක 3/2021 දරන රාජ්‍ය අයවැය චක්‍රලේඛයේ 04.02 හි iii ඡේදය. | දේශීය අරමුදල් භාවිතා කරමින් විදේශ චාරිකා සංවිධානය නොකළ යුතු අතර ශ්‍රී ලංකාව වෙනුවෙන් යම් නිල රාජ්‍යමය නිශ්චිත සහභාගීත්වයක් අත්‍යාවශ්‍ය නොවන්නේනම් සිදු නොකළ යුතු නමුත් දේශීය අරමුදල් මගින් වියදම් දරමින් සම්මන්ත්‍රන වැඩමුළු සඳහා රු. මිලියන 1.8 ක දේශීය අරමුදල් වැයකර තිබුණි. | නියමිත ක්‍රමවේදයන්ට අනුව චෙක්පතක් මගින් ගෙවීම් කිරීමට වැඩිකාලයක් ගතවන බැවින් අධ්‍යක්ෂ ජෙනරාල්තුමා එම ගුවන් ටිකට්පත සඳහා වන මුදල අතින් වැයදරා ආසනය වෙන්කර ගෙන ඇත .අනතුරුව එම මුදල ආයතනයෙන් ප්‍රතිපූර්ණය කරගෙන ඇති බව දන්වමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 255.7 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. මිලියන 249.2 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 6.5 ක පිරිහීමක් නිරීක්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කිණිහිරියා මල ටෙලිනාට්‍ය නිෂ්පාදනය කිරීමේදී හදිසි මිලදී ගැනීම් ලෙස මිල ගණන් කැඳවා 2022 අගෝස්තු 25 දිනවන විට රු. මිලියන 3.9 ක් නිෂ්පාදන කටයුතු වෙනුවෙන් දරා තිබුණි. | මෙම සැපයීම හදිසි ප්‍රසම්පදනයක් ලෙස ඉල්ලීම් කර සියලුම ප්‍රසම්පාදන කටයුතු ප්‍රසම්පාදන ක්‍රමවේදයට අනුව සිදු කර ඇත . ඒ අනුව අනුමත සීමාවන් යටතේ ගෙවීම් සිදු කර ඇත. | ව්‍යාපෘති ආරම්භ කිරීමේ අරමුණු ඉටුවන පරිදි සැලසුම් පිළියෙළ කර නිසි අධීක්ෂණයක් යටතේ ක්‍රියාත්මක විය යුතු අතර, රජයේ මුදල් අරපිරිමැසුම්දායකව භාවිතා කිරීම ගැන විශේෂ අවධානය යොමු කළ යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2015 වර්ෂයේ සිට 2022 දෙසැම්බර් 31 දිනට සභාව විසින් වෙනත් රාජ්‍ය ආයතනවලින් ලබා ගෙන තිබූ වාහන 02 ක් විධිමත්ව පවරාදීමට හෝ පවරාගැනීමට කටයුතු කර නොතිබුණි. | වෑන් රථය අමාත්‍යාංශ ලේකම්ගේ ඉල්ලීම පරිදි අමාත්‍යාංශයට තාවකාලිකව ලබා දී ඇත. සභාව වෙත වෑන් රථය ලබා ගැනීමට ඉල්ලීම් කර ඇත. සභාවට අනුබද්ධිත ආයතනයක් වන සී/ස තරුණ සේවා සමාගම වෙත තාවකාලිකව අනෙක් වාහනය ලබාදී ඇත. | විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) 2022 දෙසැම්බර් 31 දිනට සභාව වෙත පවරා තිබූ නඩු සංඛ්‍යාව 46 ක්වූ අතර, එයින් මූලික අයිතිවාසිකම් කඩවීම් සම්බන්ධ නඩු 24 ක්ද, 2011 වර්ෂයේ සිට 2022 අතර කාලය තුල සභාව විසින් පවරා තිබුණු ඉඩම් නඩු 04 ක්ද විය. මුළු නඩු සංඛ්‍යාවෙන් 09 ක් වසර 05 කට පෙර සිට පැවත එන බව මූල්‍ය වාර්තා මගින් හෙළිදරව් කර තිබුණි. | සභාව පාර්ශවකරුවකු බවට පත්කරමින් මූලික අයිතිවාසිකම් නඩු 24 ක් පවතින අතර එයින් නඩු 17 ක් 2019 වර්ෂයේ දී ස්ථානමාරු සම්බන්ධව ගොනුකර ඇත. | නඩු කටයුතු අවසන් කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) ප්‍රමාණවත් අභ්‍යාසලාභීන් සංඛ්‍යාවක් නොමැති වීම හා උපදේශන දීමනා ගෙවීම සඳහා ප්‍රමාණවත් මුදලක් සභාවෙන් ලබා නොදීම හේතුවෙන් 2022 වර්ෂයේදී දිස්ත්‍රික් 13 ක පැවති පාඨමාලා 24 ක් නතරකර තිබුණි. ඊට අමතරව රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදන තාක්ෂණ ජාතික ඩිප්ලෝමා පාඨමාලාව 2022 දෙසැම්බර් මස 31 දින දක්වා ප්‍රතීතනය කර නොතිබුණි. | 2018.06.20 ප්‍රතීතනය කර ඇති අතර , එය ඉදිරි වසර 03 ක් දක්වා දීර්ඝ කිරීම සඳහා ප්‍රතීතනය අවශ්‍ය කටයුතු මධ්‍යස්ථාන පුහුණු අංශය මගින් සිදු කරමින් පවතී. | පාඨමාලා ලියාපදිංචිය, ප්‍රතීතනය, උපදේශකයන් බඳවා ගැනීම යාවත්කාලීනව කළ යුතුය. |
| (ඈ) ජපානයේ රැකියා ලබාදීම ඉලක්ක කර ගනිමින් ජපන් භාෂා පාඨමාලාවක් ආරම්භ කිරීම සඳහා 2022 වර්ෂයේ රු.මිලියන 3.7 ක අගයකට ලැප්ටොප් පරිගණක 25 ක් මිලදීගෙන තිබුණද, අදාල පාඨමාලාව ආරම්භ කර නොතිබීම හේතුවෙන් එම ලැප්ටොප් පරිගණක ඉහත අරමුණට අදාල නොවන සභාවේ විවිධ අංශ සඳහා නිකුත් කර තිබුණි. | මිලදී ගන්නා ලද මෙම ලැප්ටොප් 25 බටංගල පුහුණු මධ්‍යස්ථානයට යොමුකිරීමෙන් අනතුරුව අදාල පාඨමාලාව ආරම්භ නොකිරීම හේතුවෙන් සභාවේ විවිධ අංශ සඳහා නිකුත් කිරීමට කටයුතු කර ඇති අතර,ඒ ඒ අංශයන්හි තොගපොත්වල සටහන් කිරීමට පියවර ගෙන ඇත. | මිලදී ගැනීමේදී අවශ්‍යතාවය පිළිබඳ සලකා කටයුතු කළ යුතු බවත්, ඒ අනුව ඒවා අදාළ අරමුණ සඳහා යෙදවිය යුතුයි. |

**3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ලෙව්වේගොඩ පුහුණු මධ්‍යස්ථානය සඳහා හාලිඇල ප්‍රාදේශීය ලේකම් විසින් ප්‍රදානය කර තිබූ අක්කර 24 රූඩ් 03 පර්චස් 53 ක්වූ ඉඩම් ප්‍රමාණයෙන් අක්කර 13 රූඩ් 03 හා පර්චස් 50 ක පිඹුරුපත අනුව භෞතිකව නොතිබූ අතර, එම ඉඩම් කොටස් මැනීම් සිදුකර ඒවායේ ප්‍රමාණය නිරවුල් කරවාගෙන නොතිබුණි. | යෞවන කටයුතු ක්‍රීඩා සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්ගේ අංක y/w/f/ 4 හා 1996.11.03 දිනැති හදිසි නීති විධි විධාන යටතේ ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂ ජනරාල් / සභාපති වෙත පවරා දි ඇති ලිපියට ඉඩම් ප්‍රමාණයක් පවතී. එම පවරා දිමට අනුව ප්‍රාදේශිය ලේකම් හාලිඇල වෙතින් අක් 10 රූඩ් 0 පර් 03 ක ඉඩම සභාව මගින් පරිහරණය කරනු ලබන අතර ඒ අවට ඇති සෙසු ඉඩම් දිර්ඝ කාලිනව වෙනත් අය සතුව පවතින අතර ඉඩම් මැනිම සඳහා අවස්ථා ගණනාවකදි ප්‍රාදේශිය ලේකම් හාලිඇල වෙතින් ඉල්ලීම් කර ඇත. | ඉඩම් කොටස් මැනීම් සිදුකර ඒවායේ ප්‍රමාණය නිරවුල් කරගත යුතුය. |
| (ආ) 1979 අංක 69 දරන ජාතික තරුණ සේවා සභා පනතේ 26(1) හා (2) වගන්ති අනුව සභාව විසින් ඉටුකරනු ලබන කටයුතු සඳහා පවත්වාගෙන යා යුත්තේ සභාවේම අරමුදලක බව දක්වා තිබුණද, පනතේ කාර්යයන් අනුව කටයුතු කිරීමට ක්‍රීඩා සමාජය හා යෞවන සමාජ පිහිටුවා තිබුණි. රු. මිලියන 20.5 ක්වූ මූල්‍ය වත්කම් පැවති මෙම සමාජවල කටයුතු සඳහා සභාවේ කාර්යය මණ්ඩලය හා | විධිමත් ව්‍යාපෘති සැලැස්මක් යටතේ තරුණ සේවා සභාව සතු ක්‍රීඩා අංශය යටතේ පාලනය වන සම්පත් උපරිම ඵලදායිතාවය යොදවා ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කර අභ්‍යන්තර ආදායම් උත්පාදනය කිරීමටත් රටේ පවතින ආර්ථික අර්බුදය අවම කර ගැනීමට ඉන් දායකත්වය ලබා දීමට ක්‍රියාකරමින් සිටින බව සඳහන් කරමි. | සභාව විසින් ඉටුකරනු ලබන කටයුතු සඳහා පවත්වාගෙන යා යුත්තේ සභාවේම අරමුදලක විය යුතු වේ. |

භෞතික සම්පත් උපයෝගී කර ගන්නා අතර, මූල්‍ය වාර්තා සභාවේ කළමනාකරණය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සභාවේ ප්‍රධාන ගබඩාවේ පැවති වටිනාකම රු. මිලියන3.5 ක් වූ අයිතම වර්ග 37 ක් ප්‍රධාන ගබඩාවෙන් විවිධ පුද්ගලයන් හා විවිධ ආයතන වෙත වසර 05 ත් 33ත් අතර කාලයක සිට තාවකාලිකව ලබා දී තිබූ අතර, ඒවා නැවත ප්‍රධාන ගබඩාව වෙත ලබා ගැනීමට, වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ගබඩාවේ අයිතම් වර්ග වෙනුවෙන් මේවනවිට පුද්ගයින්ට සිහිකැඳවීමක් කර ඇති අතර ඒ අනුව ක්‍රමානුකූලව අයකරගැනීමට හා භාණ්ඩ භාරගැනීමටත් එසේ භාර නොදෙන භාණ්ඩ වෙනුවෙන් වැටුපෙන් අයකර ගැනීමට මානව සම්පත් කළමනාකරණ අංශය එක්ව කටයුතු සිදුවෙමින් පවතී.තවද රජයේ ආයතනවලට වරින්වර වැඩසටහන් වලදී සිදිකැඳවීම් හා ලිඛිත දැනුම්දීම සිදුකර ඇත. | වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකිරීම් සිදුකර පද්ධතිය ක්‍රමවත් කළ යුතුය. |
| (ආ) එරම්ණියාය සෞන්දර්ය හා ගොවිපල පුහුණු මධ්‍යස්ථාන භූමියේ කාය වර්ධන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම හා උපකරණ කට්ටල මිලදී ගැනීම වෙනුවෙන් එකතුව රු .මිලියන 1.1 ක් වැයකර තිබුණද එම මධ්‍යස්ථානය නිෂ්කාර්යව පැවතුණි. | සෞන්දර්ය නිකේතනයේ අභ්‍යාසලාභීන් සහ යෞවන සමාජ තරුණ තරුණියන්ගේ ක්‍රීඩා අවශ්‍යතාවය සඳහා මෙම කායවර්ධන මධ්‍යස්ථානය සෞන්දර්ය නිකේතනය තුළ ස්ථානගත කිරීමට සියළු කටයුතු සූදානම් කර ඇත. | කාය වර්ධන මධ්‍යස්ථානය විවෘත කර උපකරණ කාර්යක්ෂමව භාවිතා කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) 2017 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව නිලාවෙලි ගොවිපොළ සඳහා අක්කර 200 ක ප්‍රමාණයක් ලබාදී තිබුණද, එහි පුහුණු පාඨමාලා ආරම්භ නොකර අක්කර 29.5 ක පමණක් පනතේ අරමුණු නොවන ගොවිපොලක් පවත්වාගෙන යාමට කටයුතු කර තිබුණි. වගාවන් සිදු නොකර, ආදායම් නොලබා වසර03 ක් තුල ආරක්ෂක හා නඩත්තු වියදම් වෙනුවෙන් රු. මිලියන 15.5 ක්ද ඉදිකිරීම් සඳහා රු. මිලියන 22.9 ක්ද, නීත්‍යානුකූලව අයිතිය ලබා ගැනීමේ නෛතික කටයුතු සඳහා රු.652,500ක්ද වැය කර තිබුණි. එයට අමතරව සත්ව පාලනය සඳහා රු.මිලියන 5.2 ක් වැයකර තිබුණි. | 2014 දෙසැම්බර් 20 දින අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප 135/706/2774/17/මගින් අක්කර 200ක භූමි ප්‍රමාණයක් ලබාදී ඇති බව සටහන් වී තිබුණද සංචාරක සංවර්ධන මණ්ඩලය සතු ඉඩම තවමත් අප වෙත පවරා දී නොමැත .ප්‍රදේශයේ ඉඩම් අත්පත් කර ගැනීමට සූදානම් වී සිටින භාහිර පුද්ගලයන්ගෙන් සහ වන සතුන්ගෙන් ඉඩම ආරක්ෂා කර ගැනීම සඳහා දැඩි ආරක්ෂක කටයුතු අනුගමනය කිරීමට සිදු වී ඇති බැවින්, ආරක්ෂක කටයුතු තර කිරීමට කටයුතු කිරීම නිසා වර්ෂ 03 ක් තුළ ආරක්ෂක වියදම් ඉහළ ගොස් ඇති බව ඉඩමේ නීත්‍යානුකූලව අයිතිය ලබා ගැනීම සඳහා අදාළ නීතිමය කටයුතු සිදු කිරීමට සිදු වී ඇති බැවින්, රු.652,500 ට වැය දැරීමට සිදුවී ඇත. | ඵලදායීව ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි පද්ධතිය සකස් කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ඈ) 1990 අංක 01 දරන දේපල පවරා ගැනීමේ පනතේ හදිසි නීති විධිවිධාන යටතේ සභාවට පවරා ඇති බලංගොඩ පොලිස් වසමේ හල්දලමුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ,වල්හපුතැන්න පතන වත්ත නැමැති අක්කර 01 රූඩ් 03 පර්චස් 30ක ඉඩම හා එහි පිහිටි ගොඩනැගිල්ල 2021 පෙබරවාරි 25 දින රු. මිලියන 7.6 ක් වූ අගයකට තක්සේරු කර තිබුණද, වර්තමානයේ නිෂ්කාර්යව පවතින අතර, ඉඩමෙහි පවතින ගොඩනැගිල්ල නිසි පරිදි නඩත්තු නොකිරීම හේතුවෙන් විනාශ වීමේ අවදානමකට පත්ව තිබුණි. | යෞවන සමාජ ප්‍රාදේශීය සම්මේලනයේ තරුණ තරුණියන් මගින් වගා කටයුතු ආරම්භ කිරීමට අවධානය යොමු කර ඇත. | නිෂ්කාර්ය දේපල නඩත්තු කර ප්‍රයෝජනයට ගත යුතු වීම. |

## 3.5. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂයේ සිට දින 13 සිට වසර 1 ½ ක කාලයක් තුල සභාවේ සභාපති / අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා 08 දෙනෙකු වරින් වර පත්කර තිබුණි. සභාවේ ප්‍රධාන තනතුරු 02 ක් සඳහා වැඩබැලීමේ හා කොන්ත්‍රාත් පදනමින්ද, නියෝජ්‍ය හා සහකාර තනතුරු 26 ක් හා වෘත්තීය පුහුණු උපදේශක (කොන්ත්‍රාත්) 24 ක් පුරප්පාඩු වී පැවතුණි. අනුමත නොකරන ලද තනතුරු 10 ක් සඳහා නිලධාරීන් 240 ක්ද, 2016 වර්ෂයේ සිට වැඩ බැලීම, වැඩ ආවරණය හා රාජකාරී ඉටු කිරීම සඳහා නිලධාරීන් 121 ක්ද පත් කර තිබුණි. තවද, තරුණ සේවා නිලධාරියෙකු වෙත සහකාර අධ්‍යක්ෂ ඇතුළු තනතුරු 03 ක් ලබා දී තිබුණි. | විෂය භාර අමාත්‍යවරයා විසින් ජාතික තරුණ සේවා සභාවේ සභාපති/අධ්‍යක්ෂ ජනරාල් පත් කරනු ලබන අතර, වර්තමානයේ ස්ථිර පදනමින් සභාපති/අධ්‍යක්ෂ ජනරාල් වරයෙකු පත් කර ඇති බව හා නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට ඉදිරියේදි පුරප්පාඩු පුරවන තෙක් ආවරණ රාජකාරි කටයුතු පවරා ඇති බව. | එක් නිලධාරියෙකු තනතුරු කිහිපයක නොයෙදවීමටත්, ඒ අනුව බඳවා ගැනීමේ පටිපාටියට අනුව පුරප්පාඩු පිරවීමටත් කටයුතු කළ යුතුය. |